## 12 – බිංදු බිංදු සිරි වැහි පොද

බිංදු බිංදු සිරි වැහි පොද – හිරු රැස් අතරින් හැලෙමින
දෙව් ආසිරි ගංගාවන් හා එක්වෙනවා
ගිරි කඳුවැටි මුව සිප ගෙන – මල් සුවඳක් එක්කර ගෙන
දෙව් ආසිරි සුළං රොදක් ඇත හමනවෝ
ඇත හමනවෝ

අලුත් ලොවක් සොයා – නව දිවියක් කරා //
ඔබ තබනා පියවර යට – දහසක් මල් පිපේවා
දහසක් මල් පිපේවා

දුකක් නොම වෙවා – සැපක්ම වේවා //
බාධක සැම ජය ගන්නට – දෙව් ආසිරි ලැබේවා
දෙව් ආසිරි ලැබේවා

ජයෙන් ජය වෙවා – සුවෙන් සුව වෙවා //
මංගල ආසිරි ලබමින – ඔබ සැම නිති සැරදෙවා
ඔබ සැම නිති සැරදෙවා